# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2273/76 - 2022 මාර්තු මස 31 වැනි බ්‍රහස්පතින්දා - 2022.03.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.-බී 24/51 (VII)

**(203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනත**

(203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 126 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 237 වන වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**දිලුම් අමුණුගම,**
ප්‍රවාහන අමාත්‍ය.

2022 මාර්තු මස 31 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2022 අංක 01 දරන මෝටර් වාහන (රියදුරු බලපත්‍ර වලංගු කාලසීමාව තාවකාලිකව දීර්ඝ කිරීම) නියෝග ලෙස හඳුන්වනු ලැබේ.

2. (203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතේ VII වන කොටස යටතේ මෝටර් වාහන කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කර ඇති -

(අ) රියදුරු බලපත්‍රයේ නිශ්චිතව දක්වා ඇති පරිදි 2022 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භව 2022 ජුනි මස 30 වැනි දිනයෙන් අවසන් වන නිශ්චිත දිනයක දී කල් ඉකුත්වීමට නියමිත සියලුම රියදුරු බලපත්‍රවල වලංගු කාලසීමාව එකී කල් ඉකුත්වීමේ දින සිට මාස හයක් (6) දක්වා මෙයින් දීර්ඝ කරනු ලැබේ ;


1A - PG 5798 — 510 (2022/03)


මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

(ආ) රියදුරු බලපත්‍රයේ නිශ්චිතව දක්වා ඇති පරිදි 2022 ජූලි මස 1 වන දිනයෙන් ආරම්භව 2022 සැප්තැම්බර් මස 30 වැනි දිනයෙන් අවසන් වන නිශ්චිත දිනයක දී කල් ඉකුත්වීමට නියමිත සියලුම රියදුරු බලපත්‍රවල වලංගු කාලසීමාව එකී කල් ඉකුත්වීමේ දින සිට මාස තුනක් (3) දක්වා මෙයින් දීර්ඝ කරනු ලැබේ.

3. මෙම නියෝග 2021 සැප්තැම්බර් මස 29 වැනි දින අංක 2247/17 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියෝග මගින් සංශෝධිත 2021 අප්‍රේල් මස 1 වැනි දින අංක 2221/57 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කර ලද 2021 අංක 1 දරන මෝටර් වාහන (රියදුරු බලපත්‍ර වලංගු කාලසීමාව තාවකාලිකව දීර්ඝ කිරීම) නියෝග මගින් දැනටමත් වලංගු කාලසීමාව දීර්ඝ කර ඇති රියදුරු බලපත්‍රයක් සඳහා අදාළ නොවිය යුතු ය.

EOG 03 - 1094

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.